UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

පුරප්පාඩු

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

- **<u>පූර්ණ කාලීන ස්ථිර පදනම මත</u>**

1. විශේෂඥ වෛද්‍ය නිලධාරි

1. විශේෂඥ වෛද්‍ය නිලධාරි – ක්ෂුද්‍රජීව
2. විශේෂඥ වෛද්‍ය නිලධාරි – රසායනික ව්‍යාධිවේදී
3. විශේෂඥ වෛද්‍ය නිලධාරි – හදිසි වෛද්‍ය ප්‍රතිකාර
4. විශේෂඥ වෛද්‍ය නිලධාරි – කායික රෝග
5. විශේෂඥ වෛද්‍ය නිලධාරි – ශල්‍ය වෛද්‍ය
6. විශේෂඥ වෛද්‍ය නිලධාරි – විකිරණවේදී
7. විශේෂඥ වෛද්‍ය නිලධාරි – නිර්වින්දන
8. විශේෂඥ වෛද්‍ය නිලධාරි – දැඩිසත්කාර ඒකකාර
9. විශේෂඥ වෛද්‍ය නිලධාරි – පිළිකා රෝග

<u>සුදුසුකම්:</u>

I. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ල
II. ංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධරයෙකු වීම.

හෝ

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධරයෙකු වීම.

සහ

IV. විශේෂඥ වෛද්‍ය (MD/MS) උපාධිය සමඟ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම. (2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ I වන පරිශිෂ්ටය).

සහ

V. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද “Certificate of Good Standing” ලබා තිබීම.

වයස් සීමාව:

අවුරුදු **30** ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය:

MC 1-2 පියවර 14 - රු.(161,140 - 12 × 4,850 - 219,340).

2. වෛද්‍ය නිලධාරි

1. වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය

සුදුසුකම්:

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද “Certificate of Good Standing” ලබා තිබීම.

වයස් සීමාව:

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය:

MO 1-1 රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)

*වෛද්‍ය නිලධාරි – I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ රු.137,480.00 + අනුමත අනෙකුත් දීමනා.

2. වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය

සුදුසුකම්:

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන රෝහලක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද “Certificate of Good Standing” ලබා තිබීම.

වයස් සීමාව:

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය:

MO 1-1 රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)

*වෛද්‍ය නිලධාරි – II ශ්‍රේණිය MO 1-1 පියවර 05 හි තබනු ලැබේ.රු.111,540.00 + අනුමත අනෙකුත් දීමනා.

3. වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය

සුදුසුකම්:

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

වයස් සීමාව:

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය:

MO 1-1 රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)

* වෛද්‍ය නිලධාරි – ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02 හි තබනු ලැබේ - රු. 104,090.00 + අනුමත අනෙකුත් දීමනා.

3. හෙද නිලධාරි

සුදුසුකම්:

I. සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ උපාධිය සම්පූර්ණ කර තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. පැරණී විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්වීම.

සහ

III. සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වයස් සීමාව:

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය:

MT 7 - රු.(55,910 - 10 × 800 - 11 × 1,190 - 10 ×1,320 - 10 × 1,350 -103,700)

*හෙද නිලධාරි – III ශ්‍රේණිය MT 7 පියවර 01 හි තබනු ලැබේ. - රු. 55,910.00 + අනුමත අනෙකුත් දීමනා.

4. වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී තනතුර

1. වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී - විශේෂ ශ්‍රේණිය

සුදුසුකම්:

I. සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

සහ

II. අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ සියල්ල සමත් වී තිබීම.

වයස් සීමාව:

අවුරුදු 45 ට නොඅඩු හා අවුරුදු 65 ට නොවැඩි අය විය යුතුය.

2. වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී - III ශ්‍රේණිය

සුදුසුකම්:

III. සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුලු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

IV. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

V. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෛද්‍ය රසායනාගාරවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

VI. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

VII. වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුල කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

VIII. විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී යෙකු ලෙස ශ්‍රී ලංකාව තුල කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව:

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

වැටුප් පරිමාණය:

MT 6 - රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900)

*MT 6 පියවර 01 හි (රු.55,110/-) නඹනු ලැබේ.

5. ඖෂධවේදී තනතුර

1. ඖෂධවේදී - විශේෂ ශ්‍රේණිය

සුදුසුකම්:

I. සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

සහ

II. අදාළ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ සියල්ල සමත් වී තිබීම.

වයස් සීමාව:

අවුරුදු 45 ට නොඅඩු හා අවුරුදු 65 ට නොවැඩි අය විය යුතුය.

2. ඖෂධවේදී -III ශ්‍රේණිය

සුදුසුකම්:

I. සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සමත් වීම.

සහ

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ ඖෂධවේදී/ විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධියක් ලබා තිබීම.

හෝ

IV. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන ඖෂධවේදී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

V. ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුල කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

VI. විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුල කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

වයස් සීමාව:

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

වැටුප් පරිමාණය:

MT 6 - රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900)
*MT 6 පියවර 01 හි (රු.55,110/-) තබනු ලැබේ.

6. කළමනාකරණ සහකාර තනතුර – III ශ්‍රේණිය (තාක්ෂණික නොවන)

සුදුසුකම්:

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, සිංහල/ දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත් වී තිබීම

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (**03**) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

වයස් සීමාව:

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු **45** ට නොවැඩි විය යුතුය .

වැටුප් පරිමාණය:

MA 1-2 රු.(46,220 – 10 x 540 – 7 x 630 – 12 x 1,080 – 12 x 1,280 – 84,350)

*MA 1-2 පියවර **01** හි (රු.46,220/-) තබනු ලැබේ.

7. ඩයලයිසිස් කාර්මික සහකාර තනතුර

සුදුසුකම්:

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විද්‍යාව විෂය ඇතුළත් වන පරිදි සම්මාන සාමාර්ථයන් තුනක් ඇතුලුව විෂයයන් හයක් සමත් වී තිබීම.

හෝ

II. තනතුරෙහි කාර්යභාරයට අදාළ විෂය යටතේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය සුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

III. අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

වයස් සීමාව:

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

වැටුප් පරිමාණය:

PL 2 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060)

*PL 2 පියවර **01** හි (රු.42,300/-) තබනු ලැබේ.

8. දන්ත සහායක තනතුර

සුදුසුකම්:

I. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව ඕනෑම විෂයයන් හයක් සමත් වී තිබීම

හෝ

II. තනතුරෙහි කාර්යභාරයට අදාළ විෂය යටතේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

III. අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

වයස් සීමාව:

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

වැටුප් පරිමාණය:

PL 2 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060)
*PL 2 පියවර 01 හි (රු.42,300/-) තබනු ලැබේ.

9. මධ්‍ය වන්ධ්‍යකෘත ඒකක ක්‍රියාකරු තනතුර

සුදුසුකම්:

I. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයන් තුනක් (03) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම

හෝ

II. තනතුරෙහි කාර්යභාරයට අදාළ වන යන්ත්‍ර/ සූත්‍ර ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාර්මික පුහුණුව සහිත තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification - NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

වයස් සීමාව:

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

වැටුප් පරිමාණය:

PL 2 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060)
*PL 2 පියවර 01 හි (රු.42,300/-) තබනු ලැබේ.

10. රෝහල් කාර්ය සහායක

සුදුසුකම්:

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුලුව විෂයන් හයක් සමත් වී තිබීම.

වයස් සීමාව:

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

වැටුප් පරිමාණය:

PL 1 පියවර 01 රු. (40,500 – 450 x 10 – 490 x 10 – 540 x 07 – 590 x 15 - 62,530) හි තබනු ලැබේ.

- **<u>පැයට ගෙවීමේ පදනම මත</u>**

1. හෙද සහායක

<u>සුදුසුකම්:</u>

I. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

II. අ. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) මඟින් පවත්වනු ලබන වෘත්තීය සුදුසුකම් කාණ්ඩ අංක 03 හෝ 04 (NVQ 03 හෝ 04) හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

හෝ

ආ. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි (TVEC) ලියාපදිංචි ආයතනයක් මඟින් පවත්වනු ලබන හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

හෝ

ඇ. ශ්‍රී ලංකා පෞද්ගලික වෛද්‍ය නියාමන සභාව යටතේ ලියාපදිංචි වී ඇති හෙද පුහුණු ආයතනයකින් හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

සහ

III. අවම වශයෙන් මාස හයක (06) සෞඛ්‍ය සේවයේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

<u>අමතර සුදුසුකම්:</u>

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

II. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රෝගී සත්කාර හා රසායනාගාර සේවයේ පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

III. තොරතුරු තාක්ෂණය හා පරිඝණක දැනුම පිළිබඳව ඇති හැකියාව.

<u>වයස් සීමාව:</u>

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි අය විය යුතුය.

<u>වැටුප් පරිමාණය:</u>

පැයකට රු.250.00 ක් වශයෙන් ගෙවනු ලැබේ. සේවා අවශ්‍යතාවය මත උපරිමය මසකට පැය 300 දක්වා සේවය කළ හැක.

පොදු කොන්දේසි

සෑම අයදුම්කරුවෙකුම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම සෑම අපේක්ෂක/ අපේක්ෂිකාවක්ම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලෙහි හෝ පැන නඟිනු ලබන හදිසි අවශ්‍යතාවයන් මත නම් කරනු ලබන ඕනෑම ස්ථානයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4. සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම් කරනු ලබන තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5. ස්ථිර පදනම මත තනතුරු සඳහා සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරණ අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරණු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතිය මඟින් කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව)

6. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2026.11.08** දින හෝ එම දිනට පෙර **"විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර"** යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම්කවරයේ ඉහල වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

7. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

8. අසම්පූර්ණකල ප්‍රමාද වී යොමුකරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.www.kdu.ac.lk / දුරකථන අංකය – 011 - 2044555.

සටහන: එක් එක් තනතුර සඳහා භාගත කළ යුතු නිවැරදි අයදුම්පත්‍රයන් පහත දක්වා ඇති පරිදි වේ.

අනු අංකය	අයදුම්පත්‍ර ආකෘතිය	තනතුර
පූර්ණ කාලීන ස්ථිර පදනම මත		
01	Application for the Posts of Administrative and Medical Staff	විශේෂඥ වෛද්‍ය නිලධාරී තනතුර
		වෛද්‍ය නිලධාරී තනතුර
		හෙද නිලධාරී තනතුර
02	Application for the Posts of Clerical and Allied Grades	වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී තනතුර
		ඖෂධවේදී තනතුර
		කළමනාකරණ සහකාර තනතුර – III ශ්‍රේණිය (තාක්ෂණික නොවන)
03	Application for the Posts of Minor Staff	ඩයලයිසිස් කාර්මික සහකාර තනතුර
		දන්ත සහායක තනතුර
		මධ්‍ය වන්ධ්‍යකෘත ඒකක ක්‍රියාකරු තනතුර
		රෝහල් කාර්ය සහායක තනතුර
පැයට ගෙවීමේ පදනම මත		
01	Application for the Posts of Minor Staff	හෙද සහායක තනතුර